## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2018

### Limited Competitive Examination for the Recruitment to the Grade III of the Sri Lanka Principals' Service - 2018

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය 2019 ජනවාරි මස පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු 1918ක් සඳහා බඳවා ගැනීම පිණිස පවත්වනු ලබන සීමිත තරග විභාගය වෙනුවෙන් මෙම නිවේදනයට අදාළව අයදුම්පත් භාරගනු ලැබේ. අදාළ සියලු සුදුසුකම් 2018.06.01 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

මෙම නිවේදනයේ "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයයි. "ව්‍යවස්ථා සංග්‍රහය" යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

02. මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට 2018.11.19 වැනි දිනට හෝ එදිනට පෙර හෝ ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය 2018" යන්න සඳහන් කළ යුතු ය.

03. විභාග දිනය හා නගර :

3.1 මෙම විභාගය 2019 ජනවාරි මාසයේ දී පැවැත්වේ. විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

3.2 පහත සඳහන් ප්‍රධාන නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී විභාගය පවත්වනු ලැබේ. විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ඔවුන් ඊට යාබද නගරයේ විභාග මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| කුරුණෑගල | 10 |
| පුත්තලම | 11 |
| අනුරාධපුරය | 12 |
| පොළොන්නරුව | 13 |
| බදුල්ල | 14 |
| මොණරාගල | 15 |
| රත්නපුර | 16 |
| කෑගල්ල | 17 |
| අම්පාර | 18 |
| මඩකලපුව | 19 |
| ත්‍රිකුණාමලය | 20 |
| යාපනය | 21 |
| මුලතිවු | 22 |
| මන්නාරම | 23 |
| කිලිනොච්චිය | 24 |
| වවුනියාව | 25 |

ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන විභාග මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීම අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්ට බලය තිබේ.

4. සේවා කොන්දේසි :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/31 සහ 2014.10.22 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි ද, එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලටද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ.

5. වැටුප් පරිමාණය : ජී. ඒ.- 4-2016

රු. 35,280-7x680-6x825-11x1,335-14x1,650- රු. 82,775

6. සුදුසුකම් :

6.1 පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති සේවයේ ස්ථිර කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට පත් කිරීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

6.2 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය ;

හෝ

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ;

හෝ

ගුරු පුහුණු සහතිකය/ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ;

හෝ

(iii) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව/ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.

6.3 පළපුරුද්ද :

(අ) ඉහත 6.2 (i) හෝ 6.2 (ii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම

හෝ

(ආ) ඉහත 6.2 (iii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර හයක (06) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

6.4 කායික හා මානසික යෝග්‍යතාවය :
සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

සටහන : අයදුම්පත් කැඳවන දිනට ඉහත සඳහන් පූර්වාසන්න සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන නැත්තාවූද, මෙම කාලය තුළ කරන ලද වරදකට කිසියම් දඬුවමක් (අවවාද කිරීමක් හැර) ලබා ඇත්තාවූද නිලධාරියකු/නිලධාරිනියක මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොලබයි.

6.5 වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා පවත්වන තරග විභාගය සඳහා තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර නැත.
(iii) විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර කර තිබිය යුතුය.

6.6 වයස :
උපරිම වයස 2018.06.01 දිනට අවුරුදු 50 විය යුතුය. (ඒ අනුව 1968.06.01 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

07. විභාග ගාස්තු :

රුපියල් හයසියයකි. (රු. 600.00) විභාග ගාස්තුව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදයමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කිසිදු හේතුවක් නිසාවෙන් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්තම භාවිතා කරමින් ''81/2 x 12'' ප්‍රමාණයේ කඩදාසියක සකසා අපේක්ෂකයාගේ අත් අකුරින් පුරවා එවිය යුතුය. අයදුම්පතේ ඡායස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනත් විය හැක. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ අයදුම්පත් වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය. (අංක 01 සිට 07 දක්වා මුල් පිටුවේද, ඉතිරි කොටස් ඊළඟ පිටුවලටද දක්වන්න.)

(ii) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති මාධ්‍ය භාෂාවෙන්ම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. අයදුම්පතක් තැපෑලේදී නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(iv) අයදුම්පත් ලැබුණු බව අයදුම්කරුවන් වෙත දන්වා නොයවන අතර විභාග ප්‍රවේශපත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. එම නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 05කට වත් පෙර තම ප්‍රවේශපත්‍රය

නොලද අපේක්ෂකයකු වේ නම් එම පුවත්පත් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා අයදුම්කරන විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් සඳහන් කළ ඉල්ලීම් ලිපියක් පුවත්පත් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගයට පෙනී සිටීම :

(i) නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) අපේක්ෂක/අපේක්ෂිකාවක තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාගයේ පළමුවන ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අවස්ථාවේදීම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය විභාග ශාලාධිපතිට භාරදිය යුතුය.

සටහන : අපේක්ෂක/අපේක්ෂිකාවක වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය තනතුරට පත්කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. අනන්‍යතාවය :

තමා පෙනී සිටි සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂක/අපේක්ෂිකාවක්ම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

11. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :

අපේක්ෂක/අපේක්ෂිකාවකට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂක/අපේක්ෂිකාවක විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දන දනම ඉදිරිපත් කරනු ලැබ ඇති බව සනාථ වුවහොත් හෝ එසේ නැතහොත් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කරනු ලැබ ඇති බව හෙළිදරව් වුවහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. විභාග මාධ්‍ය :

(i) විභාගය සිංහල, දෙමළ මාධ්‍ය වලින් පවත්වනු ලැබේ.
(ii) අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාග යට පෙනී සිටිය යුතුයි.
(iii) අපේක්ෂක/අපේක්ෂිකාවක විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම තමා විසින් ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන් පමණක් පිළිතුරු සැපයිය යුතුය.
(iv) ඉල්ලුම් පත්‍රයේ සඳහන් විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය :

පහත සඳහන් විෂයයන් පිළිබඳව ලිඛිත ප්‍රශ්න පත්‍රවලින් සමන්විත තරග විභාගයක ඉහළ ලකුණු ලැබූ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා එයින් සුදුසුකම් ලබන්නන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කරනු ලබන්නේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි අධ්‍යාපන විෂයය භාර රේඛීය අමාත්‍යාංශ ලේකම් විසිනි.

13.1 ලිඛිත පරීක්ෂණය : ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විතයි.

| | විෂයය | උපරිම ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | අවබෝධය | 100 | පැය 1 1/2 |
| (ii) | පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය | 100 | පැය 2 |
| (iii) | අභියෝග්‍යතාව හා සාමාන්‍ය දැනීම | 100 | පැය 1 1/2 |

- සෑම විෂයයක්ම සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතුය.

13.2 විෂය නිර්දේශය :

(i) අවබෝධය :
පාඨ කිහිපයක අර්ථය වටහා ගැනීමට අපේක්ෂකයා සතු ශක්තිය මැන ගැනීම සඳහා සහ සාරාංශගත කිරීම පිළිබඳ අවබෝධය මැන බැලීම සඳහා ප්‍රශ්න සකස් කරනු ලැබේ.

(ii) පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය :
පාසල් හා කළමනාකරණය තුළ ඇති විය හැකි සිද්ධි කිහිපයක් ඉදිරිපත් කර, එම සිද්ධිවලට ප්‍රතිචාර දක්වීම

හා ගැටලු නිරාකරණය පිළිබඳව අපේක්ෂකයින්ගේ අදහස් මතු කර ගැනීම අරමුණු කරගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.

(iii) අභියෝගයතාව හා සාමාන්‍ය දැනීම :

ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරය තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික භූගෝලීය හා අනෙකුත් අදාළ සාධක සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත් භාවය සහ අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක සහ රූපකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් හා ප්‍රතිචාරය පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

13.3 සම්මුඛ පරීක්ෂණය :

(i) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :
ලිඛිත පරීක්ෂණයට ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහලම ලකුණු ලැබූ අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබූ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වූ අපේක්ෂක සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙහිදී බඳවා ගැනීමේ ගැසට් නිවේදනය ප්‍රකාරව මූලික සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරනු ලැබේ. එයින් සුදුසුකම් ලබන්නන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

(ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
විදුහල්පති කාර්ය භාරයට අදාළ මාතෘකාවක් ඔස්සේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා පහත නිර්ණායක යටතේ ලකුණු 25ක් ලබා දෙනු ලැබේ.

| | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 1 | හැඳින්වීම | 04 |
| 2 | ඉදිරිපත් කිරීමේ සැලැස්ම | 04 |
| 3 | ඉදිරිපත් කිරීමේ කුසලතාවය | 08 |
| 4 | විෂයය දැනුම | 05 |
| 5 | කාල කළමනාකරණය | 04 |
| | එකතුව | 25 |

- අයදුම්කරුවන් ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා ලබාගත් ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවෙලට පුරප්පාඩු පුරවනු ලැබේ.

13.4 ප්‍රතිඵල නිකුත් කිරීම :

ගැසට් නිවේදනයේ 13.1 ලිඛිත පරීක්ෂණයේදී හා 13.3 (ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු වල එකතුවේ ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය විභාග දෙපාර්තමේන්තුව විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගය සඳහා පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

14. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

14.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

14.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛ, අනපනත් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි රීති අදළ වේ.

14.3 ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ iii වන ශ්‍රේණියට පත්වී වසර 03ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

14.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අක 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදළ ප්‍රවීණතා මට්ටම් පත්වීමේ දින සිට වසර 05ක් ඇතුළත ලබා ගත යුතුවේ. සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය සෑම නිලධාරියකුම බඳවා ගැනීමේ දින සිට වසර තුන (03) ක් ඇතුළත ලබා ගත යුතුය.

සටහන -
නිලධාරියකු අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමර්ථයක් ලබා තිබේනම් ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයට පෙනී සිට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

15. මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

16. සිංහල හා දෙමළ භාෂාවලින් පළ කරන මෙම ගැසට් නිවේදනයේ භාෂා පාඨ අතර යම්කිසි අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 ඔක්තෝබර් මස 05 වැනි දින.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2018

Specimen Application

Limited Competitive Examination for the Recruitment to the Grade III of the Sri Lanka Principals' Service - 2018

01. (i) විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය ඃ

සිංහල - 2
දෙමළ - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(ii)

| ඉල්ලුම් කරන නගරය | නගර අංකය |
|---|---|
| (i) | |
| (ii) | |

02. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———————————.
(උදා. ඃ HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් මුලකුරු පසුවද යොදා නම ඃ
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———————————.
(උදා. ඃ GUNAWARDHANA, H. M. S. K. )
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———————————.

03. (i) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———————————.
(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———————————.
(iii) රාජකාරී ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———————————.
(iv) විද්‍යුත් තැපැල් ලිපිනය :———————————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ
පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ජාතික හැඳුනුම්පත් අංකය

06. දුරකථන අංකය ඃ ස්ථාවර

ජංගම

07. (i) උපන් දිනය ඃ වර්ෂය ඃ මාසය ඃ දිනය ඃ

(ii) 2018.06.01 වැනි දිනට වයස ඃ

අවුරුදු ඃ මාස ඃ දින ඃ

08. (i) ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරයකු වශයෙන් පත් වූ දිනය :————.
(ii) සේවයේ ස්ථිර කරන ලද දිනය :————.
(iii) සේවා ස්ථානය :————.
(iv) 2018.06.01 වැනි දිනට සේවා කාලය ඃ

අවුරුදු ඃ මාස ඃ දින ඃ

09. අධ්‍යාපන සුදුසුකම් :

| අධ්‍යාපන සුදුසුකම් * | සමත් වූ වර්ෂය | ලබාගත් ආයතනය | සහතිකය වලංගු වන දිනය |
|---|---|---|---|
| අධ්‍යාපනවේදී උපාධිය | | | |
| උපාධිය (ක්ෂේත්‍රය . . . . .) | | | |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව | | | |
| ගුරු පුහුණු සහතිකය | | | |
| ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව | | | |

* *ගැසට්* නිවේදනයේ 6.2 ට අදාළව අයදුම් කිරීමට සුදුසුකම් ලබාඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ තොරතුරු පමණක් ඇතුළත් කරන්න.

10. මුදල් කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න :

| |
|---|
| මුදල් කුවිතාන්සියේ එක් දාරයකින් නොගැලවෙන පරිදි මෙහි අලවන්න. |

11. *අයදුම්කරුගේ සහතිකය* :

2018.06.01 වැනි දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු/සය අවුරුදු කාලය තුළ වේතනාධික සියල්ලම මවිසින් උපයාගෙන ඇති බවත්, (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මම ප්‍රකාශ කරමි. සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත් මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් විභාග ගාස්තුව ගෙවන ලද අංක . . . . . . . හා . . . . . . . . දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග පිළිබඳ නීති රීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, එම විභාගයට අදාළ වන සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ ඉන්පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. *විදුහල්පති සහතිකය* :

.............................................. (නම) වන මෙම අයදුම්කරු/අයදුම්කාරිය ........................ දින සිට මෙම පාසලේ සේවය කරන බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
විදුහල්පතිගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න)

නම :————.
සේවා ස්ථානය :————.
දිනය :————.

13. *කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය :*

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරයකු/ගුරුවරියක වන ....................... ....................... ....................... (නම) ස්වාමීන් වහන්සේ/පියතුමා/කන්‍යා සොයුරිය/මහතා/මහත්මිය/මෙනවිය ....................... විද්‍යාලයේ සේවය කරන බවත් 2018.06.01 වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු/සය අවුරුදු කාල සීමාව තුළ ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ලම උපයාගෙන ඇති බවත්, එම කාල සීමාව තුළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය යටත් නොවූ බවත්, පෞද්ගලික ලිපිගොනු අනුව මෙම අයදුම්පතේ 01-09 දක්වා අයදුම්කරු සඳහන් කර ඇති කරුණු නිවැරදි බවත් අදාළ බඳවා ගැනීම් නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි.

―――――――,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

නම :―――――――.
පදවි නාමය :―――――――.
සේවා ස්ථානය :―――――――.
දිනය :―――――――.